**උඩුනුවර ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 08 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**1.2 අහිතකර මතය**

**මෙම වාර්තාවේ 1.3 හා 2.2.2 ඡේදවල දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.**

**(අ) 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබූ ශේෂ පත්‍රයේ වත්කම් තීරුවේ එකතුව රු.354,835,659 ක් හා වගකීම් තීරුවේ එකතුව රු.354,779,094 ක් වූයෙන්, රු.56,565 ක වටිනාකමකින් ශේෂ පත්‍රය තුලනය වී නොතිබුණි.**

**(ආ) 2015 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.35,782,296 ක් වටිනා වාහන 4 ක් ගිණුම්ගත කර තිබිය දී, සමාලෝචිත වර්ෂයේදීත් එම වටිනාකම නැවත ගිණුම්ගත කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් හා ආදායමින් දායක වීමේ ගිණුම් රු.35,782,296 ක වටිනාකමින් වැඩි පුර දක්වා තිබුණි.**

**(ඇ) සමාලෝචිත වර්ෂය තුළ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ රු.21,500 ක මිලදී ගැනීම් සිදු කර ඇතත්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමේ වර්ෂයේ මිලදී ගැනීම් ලෙස රු.3,689,150 ක් දක්වා තිබුණි.**

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු බිල් කිරීම් වටිනාකම රු.50,753,750 ක් වුවත්, රු.21,916,222 ක් ලෙස ගිණුම්ගත කිරිම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.28,837,528 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබූ රු.167,349 ක ජල තැන්පතු ශේෂයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) ස්ථාවර තැන්පතු 6 කට අදාළ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු රු.1,778,346 ක පොලී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2014, 2015 හා සමාලෝචිත වර්ෂයේ දී බාහිර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ කර්මාන්ත 31 කට අදාළ රු.991,200 ක අත රැඳවුම් මුදල් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඌ) කිරි වවුල ගල් අංග මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා 2016 දෙසැම්බර් 30 දින රු.200,000 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇතත්, එම මුදල 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(එ) ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කර තිබූ රු.2,500,000 ක මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ පොලිය රු.237,878 ක් වුවත්, එය රු.875,500 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.637,622 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දී රු.120,305 ක විදුලි උපාංග නිකුත් කර ඇතත්, එය රු.10,982 ක් ලෙස දැක්වීමෙන්, රු.109,323 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඔ) රු.783,350 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි අයිතම් 48 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයේ දී විනාශ කිරීමට හඳුනා ගත් රු.62,619 ක් වටිනා පුස්තකාල පොත්, විනාශ නොකර පුස්තකාල පොත් වටිනාකමින් ඉවත් කර තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.114,000 ක් වටිනා විදුලි උපකරණවල වටිනාකම ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමයට අනුව විදුලි ගබඩා ගිණුමට හර විය යුතු වුවත්, මුළු වියදම වැය ශීර්ෂ හර කර තිබුණි. මිලදී ගැනීමකට හෝ නිකුත් කිරීමකට අදාළ නොවන හා පැහැදිලි කිරීමට අපොහොසත් වූ රු.11,400 ක වටිනාකමක් විදුලි ගබඩා ගිණුමට හර කර වැය ශීර්ෂ බැර කර තිබුණි.

(ඞ) සභාව සතු නළ ළිං 251 ක වටිනාකම් හා ඊට අදාළ ඉඩම්වල වටිනාකම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඡ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ බිල් කිරීම් රු.1,288,982 ක් වුවත්, එය රු.821,819 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.407,163 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ච) එකතු කර ගත යුතු අක්කර බදු ප්‍රමාණය නිශ්චිතව හඳුනා නොගෙන උපකල්පන පදනමක් මත රු.14,000 ක අගයක් හිඟ හිටි අක්කර බදු ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ට) ආදායම් විෂයයන් 05 කට අදාළව ලෙජර් ගිණුම් අනුව ශේෂය රු.53,097,516 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම විෂයයන්ගේ එකතුව රු.76,170,529 ක් ලෙස දැක්වීමෙන් ආදායම් රු.23,073,013 කින් වැඩි පුර දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.
---------------------------
මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 14 ක ශේෂය, උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.50,598,729 ක නොසැසඳීමක් අනාවරණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්.
-------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,667,314 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් පැවතුණත්, එම ශේෂයට හේතු වූ කරුණු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.
------------------------------------
(අ) ලැබිය යුතු ගිණුම්.
--------------------
2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, ලැබියයුතු ගිණුම් විෂයයන් 6 ක එකතු වටිනාකම රු.54,356,920 ක් වූ අතර, එම හිඟහිට තිබූ ගිණුම් ශේෂයන්හි කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්.
-------------------------
2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, ගෙවිය යුතු ගිණුම් විෂයයන් 2 ක එකතු වටිනාකම රු.36,149,310 ක් වූ අතර, එම ගිණුම් ශේෂයන් හි කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.**

**ගිණුම් විෂයයන් 6 කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.85,890,558 ක් වූ ගනුදෙනු විගණනයේ දි සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.**

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(3) ප්‍රකාරව 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අවස්ථා 76 කදි ලබා ගෙන තිබූ ටෙන්ඩර් ඇප තැන්පතු රු.158,900 ක් සහ 1989 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අවස්ථා 158 කදි ලබා ගෙන තිබූ ගිවිසුම් ඇප තැන්පතු රු.330,273 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කිරීමකින් තොරව පොදු තැන්පතු යටතේ රඳවා ගෙන තිබුණි.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.57,207,972 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.9,709,300 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.47,498,672 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 ආදායම් පරිපාලනය.**

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය.**

**වරිපනම් බදු, බදු කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.55,798,466 ක ශේෂයක් හිඟ හිටව පැවතුණි. එදිනට ලබා දී තිබූ හිඟ ආදායම් විශ්ලේෂණය හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ හිඟ ආදායම් විස්තර අතර රු.17,681,282 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. එසේම, ආදායම් ලේඛන යාවත්කාලීනව පිළියෙළ කර නොතිබීමෙන්, එම ශේෂයන්ගේ නිවැරදිතාවයන් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**2.2.2** වරිපනම්.

----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රජයේ ආයතන 17 කින් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට හිඟහිට තිබූ රු.479,688 ක හිඟ වරිපනම් ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වරිපනම් බදු එකතු කිරීමේ දී රු.1,023,556 ක මූල්‍ය අක්‍රමිකතාවයක් අනාවරණය වූ අතර, තවදුරටත් ක්ෂේත්‍රය තුළ එකී මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව කරුණු හෙළිදරව් වෙමින් පැවතුණි. මේ පිළිබඳව සිදු කරන ලද මූලික හා අවසාන පරීක්ෂණයන් අවසන් වී නොමැති බැවින්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.14,319,281 ක හිඟ හිටි වරිපනම් බදු ශේෂයේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත් වීමට නොහැකි විය.

**2.2.3** බදු කුළී.

----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයට අනුව, වර්ෂ 5 කට වරක් සභාව සතු කඩ කාමර බදු ගිවිසුම් අලුත් කළ යුතු වුවත්, දවුලගල වෙළඳපොළ පිහිටි කඩ කාමර 9 ක් සඳහා දීර්ඝ කාලීනව වසර 99 කට බදුකර අත්සන් කර තිබුණි.

(ආ) ගෙලිඔය පොදු වෙළඳ පොළ කඩ කාමර 17 කට අදාළව 2012 වර්ෂයේ දී වසරක කාලයක් සඳහා ගිවිසුම්වලට එළඹ 2016 දෙසැම්බර් මස වන විට වර්ෂ 3 ක් ගත වී ඇතත්, නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු.

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,160,551 ක් හා මුද්දර ගාස්තු රු.21,916,222 ක් අය වියයුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කාර්යසාධනය.**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) 2016 - 2019 යන වර්ෂ ආවරණය වන පරිදි සකස් කර තිබූ සිව් අවුරුදු සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුළ රු.40,350,000 ක් වටිනා කර්මාන්ත 146 ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණ ද, එම කර්මාන්ත සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාත්මක කර නොතිබුණි.**

**(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.57,207,972 ක පුනරාවර්තන ආදායමක් උපයා ගෙන තිබුණ ද, ඉන් සංවර්ධන කටයුතු සඳහා යොදවා තිබුණේ, රු.2,308,747 ක් වූ සියයට 4 ක් තරම් වූ අඩු ප්‍රතිශතයකි. එසේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන යෙදවීමකින් තොරව රු.46,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.**

**(ඇ) වැය විෂයය 304 – 5 යටතේ බදු ගෙවන ජනතාවගේ ඉල්ලීම් සඳහා සහා අරමුදලෙන් වෙන් කර තිබූ රු.2,000,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් උපයෝජනය කර නොතිබුණි.**

**(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 වන වගන්තියේ සඳහන් අරමුණු හා කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් මංමාවත් හා පදික වේදිකා අලුත්වැඩියාව හා කාණු අලුත්වැඩියාව සඳහා වෙන් කර තිබූ රු.1,500,000 ක ප්‍රතිපාදන එම අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.**

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට තනතුරු 12 ක පුරප්පාඩු හා 4 ක අතිරික්තතා පැවතුණි.**

**(ආ) සේවක ණය, අක්කර බදු, ස්ථාවර වත්කම්, පොදු සැපයුම් ණයහිමි, මුද්දර ගාස්තු, උසාවි දඩ, වරිපනම්, කඩ කුලී, ටෙන්ඩර් තැන්පතු, වැය, හා ප්‍රා.ස. ලේඛන විධිමත්ව, පවත්වා ගෙන ගොස් නොතිබුණි.**

(ඇ) 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දි කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සභා අරමුදල් මඟින් ඉටු කිරීමට යෝජිතව තිබූ රු.3,687,616 ක් වටිනා කර්මාන්ත 32 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්ගතව ණය හිමි කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකී කර්මාන්ත ඉටු කරවා ගැනීමට කටයුතු නොකර, කිසිදු හේතු දැක්වීමකින් හා අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ ණය හිමියන්ගෙන් කපා හැරීමට ද කටයුතු කර තිබුණි.

(ඊ) 2012 සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ කර්මාන්ත 45 කට අදාළ රු.1,032,032 ක අතරුදවුම් මුදල් සම්බන්ධව ප්‍රමාණාත්මක විමසීම් හා සොයා බැලීම් කිරීමකින් තොරව ආදායමට ගෙන තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.
------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ දී සභාවට ඉදිරිපත් වී තිබූ අනු බෙදුම් අයදුම්පත්‍ර 310 කින් අයදුම්පත්‍ර 59 ක වැඩ සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඇල්පිටිකන්ද මහජන පුස්තකාලයේ අස්ථානගත වී තිබූ රු.1,626 ක් වටිනා පොත් 144 ක් හා අලපලාවල පුස්තකාලයේ රු.6,388 ක් වටිනා පොත් 58 ක ඌණතාවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 මතබේදයට තුඩු දුන් ගනුදෙනු.
--------------------------------
පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119 වෙළුම ix දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙහි 01 ඡේදයේ උපදෙස්වලට පරිබාහිරව කටයුතු කර සභාව විසින් සැලසුම් කමිටු රැස්වීම්, රාජකාරී වේලාව තුළ දී පවත්වා සමාලෝචිත වර්ෂය තුළ රු.270,250 ක මුදලක් කමිටු දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) සැලසුම් කමිටු සඳහා රාජකාරී වේලාවන් තුළ සහභාගී වූ බවට දක්වා තිබූ නිලධාරීන් 6 දෙනෙකුට එම සැලසුම් කමිටු රැස් වූ දිනයන් හී රාජකාරියට වාර්තා කර නොතිබියදී කමිටු දීමනා ලෙස රු.27,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

**3.5 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්.**

**රු.1,069,000 ක් වටිනා වාහන 3 ක්, වටිනාකම හඳුනාගත නොහැකි එක් වාහනයක් හා රු.62,200 ක් වටිනා ඉන්වෙන්ට්‍රි අයිතම 2 ක් අවුරුදු 5 ක කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.**

**3.6 දෘශ්‍ය අක්‍රමිකතා.**

**2011 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ වරිපනම් බදු හා බලපත්‍ර ගාස්තු ආදායම් එකතු කිරීමේ දී, අනාවරණය වූ රු.1,114,375 ක මූල්‍ය අක්‍රමිකතාවය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.**

**3.7 කොන්ත්‍රාත් පරිපාලනය.**

**කොස්හින්න ආදාහනාගාරයේ දුම් කවුළුව දැඩි ලෙස දිරාපත්ව අබලන් වීම හේතුවෙන්, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් අලුත්වැඩියාව කරදෙන ලෙස, කරන ලද ඉල්ලීම අනුව, රු.921,980 ක ඇස්තමේන්තුවක් ලැබී තිබුණි. එහෙත්, එම ආයතනයට ඉදිකිරීම පැවරීමකින් තොරව, 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 පරිදි විධිමත් ටෙන්ඩර් පරිපාටිය ද අනුගමනය කිරීමකින් තොරව හා ගිවිසුමකට එළඹීමකින් ද තොරව අදාළ අලුත්වැඩියාව 2015 නොවැම්බර් 10 දින රු.825,000 කට ඒ පිළිබඳ නිපුණතාවයක් නොමැති උදය කර්මාන්තායතනය වෙත පවරා රු.738,169 ක් ගෙවා තිබුණි. අලුත්වැඩියාවෙන් මාස 4 කට පසුව ආදාහනාගාරය සම්පූර්ණයෙන් නැවත අක්‍රීය වී තිබුණි.**

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1 අයවැය පාලනය.**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

**(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් වියදම්, තථ්‍ය ආදායම් වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 4 ක සියයට 15 සිට සියයට 62 දක්වා ද, වියදම් විෂයයන් 6 ක සියයට 19 සිට සියයට 97 දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.**

(ආ) සභාවේ මාර්ග, ඉඩම් හා ගොඩනැගිලි ඉදි කිරීමට සඳහා වැඩසටහන් අංක 3 වැය ශීර්ෂ **304** යටතේ වෙන් කර ඇති රු.**31,552,000** ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට උපයෝජනය කර තිබුණේ රු.**218,231** ක් පමණි.

**4.2** වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.
--------------------------------

රු.**46,106,431** ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.** පද්ධති හා පාලනය.
-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඇ) ණයගැතියන් හා ණයහිමියෝ